# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2069/43 - 2018 මැයි මස 05 වැනි සෙනසුරාදා - 2018.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

මූලික පිඹුර අංක: පීපීයා 2886; පළාත: උතුරු පළාත; දිස්ත්‍රික්කය: යාපනය; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: නල්ලූර්; ගමේ නම: වන්නාර්පන්නෛ නැගෙනහිර යාපනය මහ නගර සභා සීමාව තුළ කොට්ඨාසය අංක 15; ග්‍රාම නිලධාරි කොට්ඨාසය: කන්තර්මඩම් ගිනිකොන ජේ 105; ප්‍රමාණය: 0.0328 හෙක්ටයාර්; ඉඩමේ නම: ''ආවරන්නුලක්ක''; හිමිකරුගේ නම සහ ලිපිනය: උදයකුමාර් සහ තවජෝදී අංක 8/1, කන්ද පූරාණ පාර, කන්තර්මඩම් යාපනය.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 ජුනි මස 1 වැනි දින *පූ. භා. 10.00ට නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2018 මැයි 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
නල්ලූර්.

2018 මැයි මස 02 වැනි දින,
නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-559

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ අංකය.*: BKP/LAND/ACQUI/A3/19
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය.*: 4/3/15/2016/VE/299

2018 පෙබරවාරි මස 28 වැනි දින අංක 2060/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ

1A - G 27565 - 30 (2018/05)
මෙම අති විශේෂ *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කරන ලද ඉහත සඳහන් වගන්තිය යටතේ දැන්වීම්වල සඳහන් කැබලි අංක සහ විස්තරවලට ඉදිරියෙන් හිමිකම් පරීක්ෂණ දින සහ වේලාවන් පහත දැක්වෙන ආකාරයෙන් ඇතුළත් විය යුතු බව ද 2018 මාර්තු 13 වැනි දින වෙනුවට 2018 මැයි මස 25 වැනි දින ලෙසින් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මූ.පි.කැ. /3569

| *කැබලි අංකය* | | *හිමිකම් පරීක්ෂණයට සහභාගි විය යුතු දිනය* | *වේලාව* |
|---|---|---|---|
| 01. | 01 | 2018.05.25 | පෙ.ව. 9.30 |
| 02. | 02 | -එම- | -එම- |
| 03. | 03 | -එම- | -එම- |

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
බුලත්කොහුපිටිය.

2018 මැයි මස 02 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 -560

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: RBK/LAN/AQURE/A3/65 II
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/7/2016/HW/34

අංක 2017/30 හා 2017.05.03 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වන කොටසෙහි සඳහන් අ.ග.පි. 132 අතිරේක 07හි කැබලි අංක 482 සහ 483 ඇතුළත් කර සංශෝධනය කිරීම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1 ඒ දොඹේමඩ බටහිර හා අංක 1 බී දොඹේමඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම්වලට අයත් දොඹේමඩ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අ.ග.පි. 132, අතිරේක 7, පත්‍ර අංක 9 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

**කැබලි අංකය 482**

ඉඩමේ නම: වගපේඩියාතැන්න; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දොඹේමඩ, රඹුක්කන ලිපිනයෙහි පදිංචි විල්බට් වික්‍රමසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1047.

ඉහත සඳහන් ඉඩමට මායිම් -

උතුරට: කැබලි අංක 477, 476, 485; නැගෙනහිරට: කැබලි අංක 485, 484, 483; දකුණට: කැබලි අංක 121 F; බටහිරට: කැබලි අංක 121 F, 481 , 480.

**කැබලි අංකය 483**

ඉඩමේ නම: වගපේඩියාතැන්නේ මූකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: — ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0079.

ඉහත සඳහන් ඉඩමට මායිම් -

උතුරට: කැබලි අංක 482, 485, 484; නැගෙනහිරට: කැබලි අංක 496, 121 F; දකුණට: කැබලි අංක 121 F; බටහිරට: කැබලි අංක 482.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 02 වැනි දින පෙ. ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 අප්‍රේල් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 561

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.